# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE (ECHO GROUP)

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVI YEAR OF OUR LORD JESUS CHRIST, MARCH 2022 Issue No. 4

## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 97:1-9)**

1. ස්වාමින්වහන්සේ රජකම් කරන සේක. පොළොව ප්‍රීති වේවා. ද්වීප සමූහය සන්තෝෂ වෙත්වා.

2. වළාකුල් සහ අන්ධකාරය උන්වහන්සේ හාත්පසය. ධර්මිෂ්ඨකම හා යුක්තිය උන්වහන්සේගේ සිංහාසනයෙහි අත්තිවාරමය.

3. උන්වහන්සේ ඉදිරියේ ගින්නක් යමින් හාත්පස උන්වහන්සේගේ විරුද්ධකාරයන් දවයි.

4. උන්වහන්සේගේ විදුලි ලෝකය ආලෝක කළේය. පොළොව ඒ දැක කම්පා විය.

5. හෙල් ස්වාමින්වහන්සේ ඉදිරියෙහි, එනම් මුළු පොළොවේ ස්වාමින්වහන්සේ ඉදිරයෙහි, ඉටි මෙන් උණු වූය.

6. ආකාසය උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ප්‍රකාශ කරයි. සියළු මනුෂ්‍ය වර්ගයෝ උන්වහන්සේගේ මහිමය දුටුවෝය.

7. රූප වලට මෙහෙ කරන්නාවූ, පිළිම ගැන පාරට්ටු කරගන්නාවූ සියල්ලෝ ලැජ්ජා වෙත්වා. දෙවිවරු සියල්ලෙනි, උන්වහන්සේට නමස්කාර කරවු.

8. ස්වාමිනි, සියොන් අසා සන්තෝෂ වූවාය, යුදාගේ දූවරු ඔබගේ විනිශ්චය නිසා ප්‍රීති වූය.

9. මක්නිද ස්වාමිනි, ඔබ මුළු පොළොවට උතුම් සේක. ඔබ සියළු දෙවි වරුන්ට වඩා අතිශයින් උසස්ව සිටින සේක.

## මිදි වැල, අත්තික්කා ගස සහ ඔලිව ගස

## The Vine, the Fig and the Olive!

(සහෝදර පෝල් රාජ් විසිනි)



ඉන්දීය ජනතාවගේ ජීවනයට වී, පොල් සහ කෙසෙල් ඉතා අත්‍යාවශ්‍ය වූ භාණ්ඩයක්ව තිබෙන්නා මෙන් ඉශ්‍රායෙල් සෙනඟගේ ජීවිතට මේ වැල සහ ගස් දෙක ඉතා සමීපත්වයක් ගෙන තිබේ. කඳු හා මිටියාත්වලින් ඉශ්‍රායෙල් දේශය සමන්විත වී තිබුණත් ඔවුන් පානීය ජලය ලබාගනු ලැබුයේ අහසින් වසින වර්ෂාව කරණකොටගෙනය. නමුත් වසර 430 ක් ඉශ්‍රායෙල්වරුන් වහලුන් සිටියාවූ මිසර දේශයේදී මෙවැන්නක් සිදු නොවින. මිසරයේ දී ඉශ්‍රායෙල් සෙනඟ ඔවුන්ගේ බීජ වපුරා වතුර දම්මේය. මන්ද එම දේශයේ ගොවිතැන පිණිස නයිල් ගංගාව තිබුණි. *(ද්වීතිය කථාව 11:10-11)*

මිදි වැල, අත්තික්කා ගස සහ ඔලිව් ගස ඉශ්‍රායෙල් දේශයේ තිබෙන ප්‍රධාන වැවිලි වර්ගයන් ලෙස සඳහන් කල හැකිය. හබක්කුක් පොතේ අනාගතවක්තෘ මෙසේ පවසා ඇත. ***''මක්නිසාද අත්තික්කා ගස දළු නොලෑවත්, මුද්‍රිකවැල්වල පළදාවක් නොතිබුණත්, ඔලීව ගසේ ඵල හට නොගත්තත්, කෙත්වලින් භෝජන නොලැබුනත්, ගාලෙන එළු බැටළු රැල සිඳ දමනු ලැබුවත් පට්ටිවල ගවයන් නැතුව ගියත්, මම වනාහි ස්වාමීන්වහන්සේ කෙරෙහි සන්තෝෂවන්නෙමි, මාගේ ගැලවීමේ දෙවියන්වහන්සේ කෙරෙහි ප්‍රීතිමත්වන්නෙමි.''*** *(හබක්කුක් 3:17-18)* ඔහු මෙහි සඳහන්කරනුයේ රටේ ආර්ථිකව කඩා වැටුනත් මිදි වැල, අත්තික්කා සහ ඔලිව් ගස්වල ඵල නොදැරුවත් මම වනාහී ස්වාමීන්වහන්සේ තුළ ප්‍රීතිවන්නෙමි කියාය. මෙම වැල සහ ගස් ඉශ්‍රායෙල් සෙනඟගේ ජීවිතයට සාරත්වය ගෙන දුන්නේය.


යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උන්වහන්සේගේ දේශනා වලදී නිතරම මෙම වැල සහ ගස් ගැන සඳහන් කරනු ලැබුයේය. යේසුස් වහන්සේ මෙසේ පැවසු සේක.

***''මිදිවැල මමය, නුඹලා අතුය. යමෙක් මා තුළෙහි පවතින්නේද, මම ඔහු තුළෙහි පවතිම්ද, ඒ තැනැත්තේ බොහෝ ඵල දරයි. මක්නිසාද මාගෙන් වෙන්ව කිසිවක් කරන්ට නුඹලාට බැරිය.''*** *(යොහාන් 15:5)* මිදි ඉශ්‍රායෙල් සෙනඟගේ විවාහ මංගල්‍යවල ඉතාම විශේෂිත වූ පානයකි. කානානීය පරණ මංගල්‍යයට යේසුස් වහන්සේගේ මවට, යේසුස් වහන්සේට හා උන්වහන්සේගේ ගෝලයන්ට ආරාධනා ලැබී තිබුණි. *(යොහාන් 2:1-2)*

9 වෙනි පිටුවට ...

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

*from your dearly beloved brother...*



# කැඳවීමේ ප්‍රතිරාවය

"නුඹ ස්වාමීන්වහන්සේ කෙරෙහි ප්‍රීතිමත් වන්නෙහිය. මමද පොළොවේ උසස්ථාන මතුයෙහි නැගී යන්ට නුඹට සලස්වා, නුඹේ පියවූ යාකොබ්ගේ උරුමයෙන් නුඹ පෝෂණය කරන්නෙමි. මක්නිසාද ස්වාමින්වහන්සේගේ මුඛය ඒක වදාළේය." (යෙසායා 58:14)



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

**ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රිය මිත්‍රය,**

**අපගේ ස්වාමිවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලවත්වූ නාමය කරණකොටගෙන ප්‍රේමයේ සුභ පැතුම් ගෙනෙමි.**

ඔබත් ඔබගේ පවුලේ සියලු දෙනාත් දෙවියන්වහන්සේගේ කරුණාවෙන් සුවයෙන් සිටියි කියා මා විශ්වාස කරමි. මමද මගේ සේවක මඩුල්ලද යන සියලුදෙනාම සැමදාම ඔබ වෙනුවෙන් ස්වාමින්වහන්සේ ඉදිරියෙහි යාච්ඤා කරමු. මේ මුළු ලෝ තලය පුරාවටම භීෂණයක් ඇතිව සිටින අවස්ථාවේ දී දෙවියන්වහන්සේගේ ආරක්ෂාව ඔබට අවශ්‍ය බව අපි දනිමු. අද මුළු ලෝකයෙහිම සිටින සෙනඟ භයෙන් ජීවත් වෙති.

සැම දිනකම සිය ගණන් සෙනඟගේ යාච්ඤා ඉල්ලීම් අප වෙතට පැමිණෙයි. අපගේ කාර්යාලයට ලැබෙන එම ලිපි දුරකථන ඇමතුම්, විද්‍යුත් තැපැල් යන සියල්ල වෙනුවෙන්ම අපි නොකඩවාම යාච්ඤා කරමු. සැබවින්ම දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයේ ක්‍රියා කරයි කියා අපි විශ්වාස කරමු.

අද ලෝකය පුරාවටම ඉතා වේගයෙන් පැතිරී යන්නාවූ මෙම වෛරස් රෝගය නිසා බොහෝ දේව දාසයින් හා ඇදහිලිවතුන් ඔවුන්ගේ ආත්මික ගමනේ වේගය අඩුකර ගෙන ඇත. ඔබත් ඒ අය අතරින් එක්කෙනෙක්ද?

එය ඉතා යහපත් වූ දෙයක් නොවේ. පසුගිය කාලයේ දී යාච්ඤාව කරණකොටගෙන ඔබගේ ජීවිතයේ සිදු වූ දේ ඔබ සිහිකල යුතුය. ඔබ ඔබගේ යාච්ඤා ජීවිතය, දෙවියන්වහන්සේට දෙන දීමනාවන්, සභාවේ වැඩ කටයුතු සමහර වෙලාවට අතපසු කර ඇත. ඔබ සිටින තත්වයෙන් නැවත නැගිටින්නය කියා දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේ ඔබට පොළොඹවනවා ඇත. එබැවින් මේ පණිවිඩය තුළින් ඔබ නැවත නැගිටින්න කියා මා ඉල්ලා සිටිමි.

ඔබගේ ආත්මික ගමන නැවත පටන්ගන්න. ස්වාමීන්වහන්සේ ඔබගේ සියලු අවශ්‍යකම් සපයනු ඇත. එන්න තිබෙන දවස්වලදී ඔබගේ ජීවිතය ඵලදායී කරයි. අපගේ යාච්ඤා වලදී අපි ඔබව දරා ගනිමු.

අද මේ ලෝකයේ සිදුවන සැම දේම අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත පැමිණීම ගැන අපට මතක් කර දෙයි. අප හැමදෙනාම

CHIEF EDITOR
Angeline Selvakumari Henry, M.A., M.Ed.
MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
ADMINISTRATION
Bro. N. Prakasam, M.A., General Manager
EDITORIAL BOARD
Sis. Jesy Veena Sam
Bro. M. Paulraj, M.A., B.Ed.
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858
E.mail ID
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ◌ BIBLECOR - Postal Courses (3 languages) ◌ Online Courses ◌ Theological Correspondence Courses (2 languages) ◌ Church Planting ◌ Nehemiah Bible Colleges ◌ Gospel Printing Press ◌ Great Commission Partners ◌ St. Paul's Matriculation School ◌ Crusades ◌ Community Development

දෙවියන්වහන්සේගේ විනිශ්චය දවසේ දී සිටගත යුතුය. ඔබගේ ජීවිතය ස්වාමීන්වහන්සේට කැපකර විශ්වාසවන්තව සිටින්න. ස්වාමින්වහන්සේ ඔබට අවශ්‍ය කරුණාව ලබා දෙනු ඇත.

කැඳවීමේ ප්‍රතිරාවය සේවය ගැන නිරන්තරයෙන් උපකාර කර යාච්ඤා කරන්න. මේ කාලයේ දි ඔබගේ යාච්ඤාව හා උපකාරය අපට ඉතාම අවශ්‍යව ඇත. අපගේ සහකාර කර්තෘ සහෝදර පෝල් රාජ් හා පාස්ටර් මුත්තුගේ ඉක්මන් සුවය උදෙසා යාච්ඤා කරන්න.

අපගේ සභාවන් පාසැල් සහ බයිබල් විදුහල රටේ පවතින තත්වය නිසා තවමත් වසා ඇත. මේ මුළු ලෝකය තුළින්ම මෙම වෛරසය දුරුවෙන්නය කියා යාච්ඤා කරන්න.

ඔබට වේලාවක් තිබේ නම්, කැඳවීමේ ප්‍රතිරාවය YouTube Channel එකට ගොස් දැකගැනීමට හැකිය.

ඔබ සැම දෙනාමට දෙවියන්වහන්සේ ආශිර්වාද කරන සේක.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

**පාස්ටර් සැම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සැම්සන් සැම්**

(+91) 98412 71858 / 98410 71858, E.mail : samselvaraj333@gmail.com

*1 පිටුවෙන්....*

***මතෙව් 24:32*** හි යේසුස් වහන්සේ මෙසේ පවසයි. අත්තික්කා ගසේ දළු දමන විට ග්‍රීස්ම කාලය පැමිණෙන බව පෙන්නුම් කරයි. නෝවා නැවේ සිටින විටදී ඔහු දෙවෙනි වර පරවියෙක් නැවෙන් පිටතට යැවූ අතර නැවත එම පරවියා නැවට එන විට උගේ හොටෙහි ඔලිව් ගසේ දල්ලක් තිබුණි. එනම්, එය පොළොවෙන් වතුර බැස යන බවට ලකුණක්ව තිබුණි.

***(උත්පත්ති 8:11)*** යේසුස් වහන්සේ රාත්‍රී කෑම පත් පසු උන්වහන්සේගේ ගෝලයන් සමඟ ගී ගායනා කර පසුව ඔලිව් කන්දට ගියෝය. ***(මාර්ක් 14:26)*** එසේ මිදි, අත්තික්කා සහ ඔලිව් යන වර්ග තුනම ඉශ්‍රායෙල් සෙනඟගේ එදිනෙදා ජීවිතයට අදාළ වූ ඒවා වන්නේය.

## මිදි වැල

*(ගීතාවලිය 80:8-15)*

මෙහිදී ස්වාමීන්වහන්සේ මෙසේ සඳහන් කරනු ලබයි. මිසරයෙන් මිදි වැලක් ගෙනවිත් කානාන්හිදී පැල කල බවයි. ස්වාමීන්වහන්සේ බලාපොරොත්තු වූයේ හොඳ ඵලය නමුත් ලැබුනේ ඇඹුල් ජලය ඒවා මුල් ඇද දේශය පිරුණේය. ජාතීන් අතර බලපෑම් ඇති කලේය. නුමුත් ස්වාමීන්වහන්සේ වැට කඩා දැමූ සේක.

මෙහිදී මෙම මිදි වත්ත ගැන පවසන්නේ එය ඉශ්‍රායෙල් සෙනඟ බවයි. *(යෙසායා 5:17)* දෙවියන්වහන්සේ උන්වහන්සේ විසින් තෝරාගත්තාවූ සෙනඟ මිසරයෙන් ගෙනා සේක. මොසෙස්ගේ නායකත්වය යටතේ ඔවුන්ව වහල්කමෙන් මුදවා ගත් සේක. කානාන් දේශය පහතට දමා මා ඔවුන්ගේ දේශය නැවත ඔවුන්ට දුන්නේය. දාවිත්ගේ නායකත්වයෙන් ඔවුන් බලවත් ජාතියක් වූවේය. ඔවුනගේ නාමය මුළු ලෝකයෙහිම කීර්තිමත් බවට පත් විය. නමුත් මේ ජාතිය ස්වාමීන්වහන්සේ එපා කළේය. සාලමොන් රජතුමා පවා අන් දෙවිවරු පස්සේ ගියේය. සාලමොන්ට පස්සේ ඔවුන්ගේ පුත්‍රයින්ගේ කාලයේදී ඊශ්‍රායෙල් රාජ්‍ය දෙකකට වෙන්විය.

ඊශ්‍රායෙල් රාජයේ අගනුවර සමාරිය වූ අතර, යුදා රාජයේ අග නුවර යෙරුසලම විය. ඊශ්‍රායෙල් ගෝත්‍රයේ පළමු රජවන යෙරබෝවන් රන්වස්සන් දෙදෙනෙක් සාදා දාන් සහ බෙන්ජමින් යන ස්ථානවල තැබීය. ඔහු ඒවාට මිසරයෙන් ගෙනා දෙවිවරු මේය කියා ඔහු පැවසීය. පරාවෝගේ හස්තයෙන් ගලවාගත් දෙවියන්වහන්සේ ඔවුන් අමතක කල දැමීය. මොසෙස් හා යොෂුවාගේ

**Statement about ownership and other particulars about the Newspaper Echo of His Call (Sinhala) - Form IV (See Rule 8)**

| | | |
|---|---|---|
| 1. Place of Publication | : | **New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah Sahib 2nd Street, Chepauk, Chennai - 600 005.** |
| 2. Periodicity | : | **Monthly** |
| 3. Printer, Editor, Owner & Publisher | : | **S. Sam Selva Raj** (Same Address) |
| 4. Nationality | : | **Indian** |

I **S. Sam Selva Raj**, hereby that the particulars given above are true to the best of my knowledge and belief.

**March 2022** **S. Sam Selva Raj.**

නායකත්වයෙන් දෙවියන්වහන්සේ ඔවුන්ට මග පෙන්වමින් ඔවුන්ට පොරොන්දු දේශය වූ කානාන් දේශය අත්පත් කර දුන්නේය. නමුත් මේ සියල්ල කලාවූ දෙවියන්වහන්සේව ඔවුන් අමතක කර දැමුවේය. සෑම ගසක් යටම රූප සාදා ඊට නමස්කාර කළේය. ඒ නිසා දෙවියන්හන්සේ ඊශ්‍රායෙල්වරුන් සමග කෝප වී ඔවුන්ව අසිරිය රජතුමාට වහලුන් ලෙස රැගෙන යාමට සැලැස්වීය. යුදාවරුන්ව ද බබිලෝනිවරුන් වහල්කමට රැගෙන ගියෝය. මේ සියල්ල සිදු වූයේ සර්වබලධාරි දෙවියන්වහන්සේව ප්‍රතික්ෂේප කල නිසාය. දෙවියන්වහන්සේ ඔවුන් කෙරේ තැබූ ආරක්ෂාව ඉවත් කලේය.

හොඳ එල දැරීමට තිබූ මිදි වැල ඇඹුල් එල දුන්නේය.

අදත් යේසුස්වහන්සේගේ ලේ වලින් මිදීම ලබා සෑම ආශිර්වාද ලබා ගත්තාවූ අපි උන්වහන්සේ අමතක කර දමා යක්ෂයාගේ මාර්ග තෝරාගෙන තිබේ. යක්ෂයා ඔවුන්ව විනාශය කරා ගෙන යන බව ඔවුන් තේරුම් නොගනී. සොරා එන්නේ සොරකම් කරන්නත් මරන්නටත් හා විනාශ කිරීමටත්ය. ***(යොහාන් 10:10)*** අප යක්ෂයාගේ සියළු උපක්‍රම වලින් හා බොරුවෙන් අප ආරක්ෂා කල යුතුය.

මිදි වැල ඉතා ප්‍රිය මනාප වූ එළ දෙන්නාවූ වැලක්ය. මෙය වගා කරන පිණිස ගොවියෝ පොළොව කොටා පොහොර දමා බිම සකස් කරති. එම වැල වැඩෙන විට එයට මැස්සක් ගසා එහි අතු විහිදී යාමට ඉඩ හැරිය යුතුය. ගොවියා එම වැලෙහි හැම අත්තක්ම බලමින් එල දරන පිනිස එයට සාත්තු කරයි. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක. ***''මම සැබෑවූ මිදිවැලය, මාගේ පියාණන්වහන්සේ ගොවියාය. මා තුළෙහි තිබී එල නොදරන සියලු අතු උන්වහන්සේ පහ කරන සේක. එල දරන වඩා එළ දරන පිණිස උන්වහන්සේ පවිත්‍රකරන සේක.''*** *(යොහාන් 15:1-2)*

මිදි වැල මෙන් බුලත් වැලද ඉන්දීය දේශයේ තමිල්නාඩු ප්‍රාන්තයේ වැවෙන්වාවූ වැලකි. එය මිදි වැලත් මෙන් වැඩේ. මාගේ මිත්‍රයෙක් ද මෙවැනි බුලත් වත්තක් වගා කර තිබේ. ඔහු ඒවා පැල කිරීමට පෙර පොළොව අඩි හතරක් හෝ පහක් ගැඹුරට හාරා එම පස් ඉවත් කර වෙනත් ස්ථානයකින් ලබාගත් හොඳ පස් ගෙන ඒවා සමග වැලි සමග මිශ්‍ර කර අඩි දෙකක් හෝ තුනක් උසට සකස් කල බිමෙහි දමා එම පැල නිසි ලෙස රෝපනය වන පිණිස පොළාවෙ හරියාකාරව සකස් කරයි. මිදි වැල ද රෝපනය කිරීමේදී මේ ආකාරයට පොළොව සකස් කර බොහෝ එල දරණ පිණිස එනම් මනුෂ්‍යාගේ ජීවිතයට ඔවුන්ගේ ජීවනෝපාය සාරවත් කිරීමට උපකාරී වේ. එහි ඇතිවන එළ නිවෙස්වල හා ආපනශාලාවල මෙය පරිභෝජනය කරන්නාවූ මනුෂ්‍යයන්ව ඉතා සතුටට පත් කරන යහපත් වූ පලතුරක් ලෙසද හඳුන්වනේය. මේ ආකාරයට මිදි වැල ඉතා මහන්සියෙන් හා උනන්දුවෙන් පැල කර ඉතා අවධානයෙන් බලා ගත යුතු වැලකි. මන්ද එහි බොහෝ එල දරණ පිණිස දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟට මේ ආකාර එල දරණ අය වෙයි කියා බලාපොරොත්තු වෙති.

## මිදි වත්තේ අත්තික්කා ගස

වරක් යේසුස්වහන්සේ මිදි වත්තේ අත්තික්කා ගසක් දැක එහි කොළ හැර එළ නොතිබූ බව දුටුවේය. තවද වසර තුනක් එල නොදැරූ අත්තික්කා ගසක් මිදි වත්තේ ඇති බව දුටු අයිතිකරු එහි එල නැති නිසා එම ගස කපා දැමීමට අණ කළෝය. නමුත් වත්ත බලා ගන්නා එහි අයිතිකරු ''මේ ගස එල දරනවා ද නැද්ද කියා තව එක වසරක් බලමු'' කියා පවසා එම ගස බේරා ගත්තේය.

යේසුස්වහන්සේ ද එල දැරීමේ වැදගත්කම ගැන කතා කරයි. මිදි වත්තේ තිබූ අත්තික්කා ගස ගැන උපමවා උන්වහන්සේ කතා කරනු ලැබුයේ මිදි වත්ත මැද අත්තික්කා ගසක් තිබෙන විට එය එල දැරිය යුතු බවයි. ***(ලූක් 13:6-9)***

මිදි වත්ත ඊශ්‍රායෙල් සෙනඟව නියෝජනය කරයි. අත්තික්කා ගස ඊශ්‍රායෙල් සෙනඟ සමග එකතුවන අන්‍යජාතින් ගැන සඳහන් කරයි. අන්‍ය ජාතින් ගැලවීම ලබා එල දරයි කියා දෙවියන්වහන්සේ බලා සිටියි. යේසුස්වහන්සේගේ නියෝගය නම් එළ නොදරන සියළුම ගස් කපා ගින්නට දැමිය යුතු බවයි ***(මතෙව්***

*....Contd. to page 6*

Pray for नहेम्याह बाइबल कॉलेज रेसिडेन्शल कॉलेज, चेन्नई।
माध्यमः हिन्दी
*सदस्यता के लिए पंजीकृत उम्मीदवार* - ATA
सुविख्यात अंतर्राष्ट्रीय मसीही अगुवे तथा पिछले 53 वर्षों से सेवारत वरिष्ठ पासवान
सर्टिफिकेट इन थियोलॉजी — 1 साल
डिप्लोमा ऑफ थियोलॉजी — 2 साल
योग्यता 10 वी या अधिक
जल्दी करें!
**Contact : The Chairman, Nehemiah Bible College.**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
★ ऑनलाइन कक्षाएं उपलब्ध हैं ★

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1989

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**මාර්: 19-** යේසුස්වහන්සේ තුළ ගැලවීම ලබාගත් නවක කිතුණුවන් ගැන ස්තුති කරන්න.

**මාර්: 20-** දෙවියන්වහන්සේගේ කැඳවීමට කීකරුවී සේවය කරන අය ගැන ස්තුති කරන්න

**මාර්: 21-** යේසුස්වහන්සේ දුන් ගැලවීම කරණ කොටගෙන මත්ද්‍රව්‍යවලින් නිදහස් වූ අය ගැන ස්තුති කරන්න

**මාර්: 22**- "කැඳවීමේ ප්‍රතිරාවය" නිර්මාතෘ සෑම් සෙල්වරාජ් දේවගැතිතුමා ගැන ස්තුති කරන්න.

**මාර්: 23**- භාෂා 17 කින් මුද්‍රණය වන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය ගැන ස්තුති කරන්න.

**මාර්: 24**- දේව සේවය උදෙසා දෙවියන්වහන්සේ සපයන බැවින් ඒ ගැන ස්තුති කරන්න.

**මාර්: 25**- කිතුණු සභාවලට අලුතින් එක්වූණ ඇදහිලිවතුන්ගේ ආත්මික වර්ධනය ගැන ස්තුති කරන්න.

**මාර්: 26**- දේව සේවය තුළ සෑම යහපත් බලාපොරොත්තු සඵලකර දුන් දෙවියන්වහන්සේට ස්තුති කරන්න.

**මාර්: 27**- සිය ඇදහිලිවතුන්ට දේවධර්මානුකූල ජීවිතයක් ගතකිරීමට මගපෙන්වන සභා පාලකවරුන් ගැන ස්තුති කරන්න

**මාර්: 28**- වර්තමානයේ සෑම බයිබල් විදුහලකම ඇති ආර්ථික ප්‍රශ්න උදෙසා දෙවිඳුන් යාච්ඤා කරන අය ගැන ස්තුති කරන්න.

**මාර්: 29**- යාච්ඤාවෙන් හා උපකාර කිරීමෙන් දේව සේවයට උදව් කරන අය ගැන ස්තුති කරන්න.

**මාර්: 30**- රජයේ පාසල් පද්ධතියට සම්බන්ධ වී සිටින කිතුණු පාසල් ගැන ස්තුති කරන්න.

**මාර්: 31**- "කැඳවීමේ ප්‍රතිරාවය" සේවයේ සෑම සහකාර සේවකයන් ගැන ස්තුති කරන්න.

**2022 අප්‍රේල් මාසය**

**අප්‍රේ: 01-** මාර්තු මාසය පුරාම අප ආරක්ෂා කල දෙවියන්වහන්සේගේ බලවත් හස්තය ගැන ස්තුති කරන්න.

**අප්‍රේ: 02-** අධිකරණය සහ පොලීසිය තුළ සේවය කරන සෑම නිළධාරීන් ගැන ස්තුති කරන්න.

**අප්‍රේ: 03-** දේශ සීමා පවතින රටවල දේශ සීමා ආසන්නයේ ජීවත්වන අය ගැන ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**අප්‍රේ: 04-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයට මෙම මාසය තුළ මුදල් ප්‍රතිපාදන ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ: 05-** බොහෝ ආර්ථික ප්‍රශ්න හා දිළිඳුකමින් පෙලෙන අය උදෙසා යාච්ඤා කරන්න.

**අප්‍රේ: 06-** කුඩා දරුවන් නොයෙකුත් අපචාර ක්‍රියා තුළින් බේරාගන්නා පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ: 07-** කිතුණු පවුල් වල ආර්ථික, ආත්මික, ශාරීරික, හා මානසික සුවය පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ: 08-** ඉශ්‍රායෙලයේ සමාදානය උදෙසා යාච්ඤා කරන්න.

**අප්‍රේ: 09-** අල්ලස් ගැනීමට පෙළඹවීමක් ඇති අය ඉන් නිදහස් වන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ: 10-** ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමට යන ධීවරයින් ගැන යාච්ඤා කරන්න.

**අප්‍රේ: 11-** පාලක සෑම් සෙල්වරාජ් ඇතුළු ඔහුගේ පවුලේ සාමාජිකයන් නපුරු උවදුරු වලින් ආරක්ෂා කරන මෙන් යාච්ඤා කරන්න.

**අප්‍රේ: 12-** කිතුණු මිෂනාරිවරුන් ගැන යාච්ඤා කරන්න.

**අප්‍රේ: 13-** කිතුණු ඇදහිලිවතුන්ට ගෞරවනීය දේව භයක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ: 14-** කිතුණුවන් යේසුස්වහන්සේට වඩාත් ආදරය කරන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ: 15-** රැකියා, විරහිත, සුදුසු රැකියාවක් අපේක්ෂාවෙන් සිටින අය උදෙසා යාච්ඤා කරන්න.

**අප්‍රේ: 16-** සුදුසු විවාහයක් අපේක්ෂාවෙන් සිටින අය උදෙසා යාච්ඤා කරන්න.

**අප්‍රේ: 17-** අපට විරුද්ධ වැරදි කළ අයට සමාව දී නිදහස් කර යාච්ඤා කරන්න.

**අප්‍රේ: 18-** සෑම කිතුණුවෙක්ම යේසුස්වහන්සේගේ ඉගැන්වීම් වලින් සන්නද්ධ වන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

***3:10)*** එනම් ඊශ්‍රායෙල් නොවන අන්‍ය ජාතීන් ගැලවීම ලැබූ පසු හොඳ ඵල දරන්නාවූ පුද්ගලයින් ලෙස වෙනස් විය යුතු බවයි.

වත්ත බලාගන්නා එනම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පියාණන්වහන්සේට කන්නලව් කරමින් එම අත්තික්කා ගසට ඵල දරන පිණිස තවත් අවස්ථාවක් ලබා දෙන්නැයි කියා පවසයි. එනම් පොහොර සහ වතුර දමා බලා ගනිමින් යේසුස්වහන්සේ එයට විශේෂ සැලකිල්ලක් දක්වන බවයි. උන්වහන්සේගේ දෙවියන්වහන්සේ කරන කොට ගෙන අප ඵල දරණ පිණිස යේසුස්වහන්සේ පවසනු ලබන්නේ ස්වාමින්වහන්සේ තුල පවසමින් බොහෝ ඵළ දරණ ලෙසය. ***(යොහාන් 15:5)***

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සිංහාසනයෙහි සිට පොළොවේ සිටින සෑම දෙනා දෙසම බලා සිටී. ***(ගීතාවලිය 11:4)*** උන්වහන්සේ ධර්මිෂ්ඨ විනිශ්චයකාරයාණෝය. උන්වහන්සේගේ සත්‍යතාවය තුලින් හා ධර්මිෂ්ඨකම තුලින් උන්වහන්සේ ලෝකයාව විනිශ්චය කරනු ලබයි.

***''මක්නිසාද උන්වහන්සේ එන සේක, පොළොව විනිශ්චය කරන පිණිස එනසේක. උන්වහන්සේගේ ධර්මිෂ්කමින් පොළොව ද ස්වකීය සැබෑකමෙන් මනුෂ්‍ය වර්ගයන් ද විනිශ්චය කරන සේක. (ගීතාවලිය 96:13)***

අන්ධකාරයෙහි ජීවත්වන ලෝකයෙහි සිටින අන්‍ය ජාතින්ව ස්වාමින්වහන්සේ වෙතට ගෙනෙන පිණිස දෙවියන්වහන්සේගේ විශේෂ සැලැස්මක් තිබේ. මේ නිසා උන්වහන්සේගේ ඒක ජාතක පුත්‍ර වූ යේසුස්වහන්සේගේ පූජාව කරන කොටගෙන යක්ෂයාගේ වහක්කමෙන් සෑම දෙනාවම මුදවන පිණිස උන්වහන්සේගේ ලේ වගුරුවා මහත් වූ මිලයක් ගෙව්වේය. ඕනෑම කෙනෙක් ස්වාමි වූ යේසුස්වහන්සේව විශ්වාස කර උන්වහන්සේගේ යාගය පිළිගන්නේ නම්, ඔවුන්ට උන්වහන්සේගේ දරුවන් වීමට බලය දෙන සේක. ***(යොහාන් 1:12, 3:16)***

ස්වාමි වූ දෙවියන්වහන්සේ අන්‍ය ජාතීන්ට ශුභාරංචිය ප්‍රකාශ කරන පිණිස පාවුලුතුමාව තෝරාගනු ලැබුවේය. දෙවියන්වහන්සේගේ කැමැත්ත නම්, කිසිවෙක් විනාශ නොවී ගැලවීම ලැබීමය. ඉශ්‍රායෙල්වරු යේසුස්වහන්සේ ප්‍රතික්ෂේප කලේය. ඔවුන් ඔවුන්ගේ හදවත් දැඩි කර ගත්තේය. එමනිසා ශුභාරංචිය අන්‍ය ජාතීන් වෙතට ගෙන ගියේය. මිදි වත්තෙහි අත්තික්කා ගස් පැල විය. එනම් මිදිවැල් අතරට පැමිණි සියලුම අත්තික්කා ගස් පල දැරිය යුතුය.

## ඔලිව් ගස

ඉශ්‍රායෙල් දේශයේ ඔලිව් ගස භෝග වර්ගයකි. ඔලිව ගස සහ මිදි වැල ඉශ්‍රායෙල් දේශයේ සෑම පලාතකම තිබෙන්නාවූ බෝග වර්ගයකි. ඔලිව ගස මනුෂ්‍ය ජීවිතයට මුදල් උපයන්නාවූ භෝග විශේෂයකි. මුල් ලෝකයෙහි ඔලිව් තෙල් සෑදීමේදී මෙය ඉතා විශේෂිත වු හා ප්‍රසිද්ධ ගසකි.

බයිබලයෙහි අපට එක්තරා සිදු වීමක් ගැන දක්නට ලැබේ. එනම්, එක්තරා ප්‍රොපේතවරයෙක් මැරුණු අතර ඔහුගේ වැන්දඹු බිරිඳ ඔහු සිටි කාලයේදි ගෙවීමට තිබූ ණය මුදලක් ගෙවීමට බැරිව සිටින ලදී. මෙම වැන්දඹු ස්ත්‍රිය එලීෂා ප්‍රෝපේතවරයා ළඟට ගොස් ඇගේ මෙම කතාව පවසන ලදී. එලීෂාද 'මා නුඹට කුමක් කල යුතුද? නුඹ ළඟ තිබෙන්නේ මොනවාද ?' කියා ඇසීය. ඇය ද මා ළඟ තෙල් කුලාවක් මිස වෙන කිසිවක් නැත' කියා පැවසීය. එවිට එලීෂා ප්‍රොපේතවරයා නුඹ අසල්වාසී නිවෙස් වලට ගොස් හැකි පමණ භාජන එකතු කොට තෙල් කුලාවේ ඇති තෙල් එම භාජන වලට වත් කරන්න.'' ය කියා පැවසීය. ඈ එසේ කර සියලු භාජන පිරුණු අතර තවත් භාජන සොයා එන ලෙසට ඇගේ පුත්‍රයාට පැවසූ නමුත් තවත් භාජන නොමැති බව පැවසීය. එවිට තෙල් නැවතිණ. එම තෙල් විකුණා ණය මුදල ද ගෙවන්නය කනියා එලීෂා පවසනු ලැබීය. ***(2 රාජාවලිය 4:1-7)*** මෙම ඔලිව් තෙල් ඇගේ ණය බරෙන් ඇයව මුදවාගත්තේය.

පාවුලු තුමා ***රෝම 11:17*** හි පවසනු ලබන්නේ අන්‍ය ජාතීන් ඉශ්‍රායෙල්ට පාස්සනු ලැබ ඔවුන්ගේ සාරවත්කම් මුලට පංගුකාරයන් වී ඇති බවයි. ***''නමුත් සමහර අතු කඩා දමන ලද්දේ වී නම්, වල් ඔලීව ගසක වු නුඹ ඒවා අතරේ පාස්සනු ලැබ ඔලිව ගසේ සාරවත්කමේ මුලට පංගුකාරයෙක් වූයෙහි නම්,'' (රෝම 11:17)***

පාවුලුතුමා මෙහි සඳහන් කරනුයේ සමහර ඔලිව් ගස් කපා වල් ඔලිව ගස් බද්ධ කල බවයි. ***''... මක්නිසාද ගැලවීම යුදෙව්වරුන්ගෙන්ය...''(යොහාන් 4:22) ''... අන්‍ය ජාතීන්ගේ සම්පූර්ණත්වය පැමිණෙනතුරු ඉශ්‍රායෙල්වරුන්ට තරමක් දුරට දැඩි කමක් පැමිණ තිබෙන බවය. (රෝම 11:25)***

ඉශ්‍රායෙල් සෙනඟගෙන් කොටසක් ඔවුන්ගේ හදවත දැඩි කරගත් නිසා අන්‍ය ජාතීන්ගේ ගැලවිම සම්පූර්ණවන තුරු ඔවුන්ට බලා සිටීමට සිදු වන්නේය.

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟව ලෝකයෙන් කැඳවා ඔවුන්ට විශේෂ දීමනාවක් දුන් සේක. ***(රෝම 11:29)***

ගැලවුම්කාරයාණෝ සියෝන්හි සිට පැමිණ යාකොබ්ගේ බාධාව ඉවත් කරනවාය කියා දේව වචනය පවසයි.

යේසුස්වහන්සේ ඊමෙන් පසු ඉශ්‍රායෙල් සෙනඟට අත්පත් කරගැනීම සඳහා විශේෂ අවස්ථාවක් ලැබෙනු ඇත. සභාව ඔසවාගැනීමෙන් පසු දේව දූතයන් හතර දෙනෙක් සුළඟ තමාගේ දෑතින් අල්ලාගෙන එය පොළොව පිටට පිම්ඹේය. තවත් දේව දූතයෙක් ශබ්ද නඟා "අපගේ ස්වාමි වූ දෙවියන්වහන්සේගේ දාසයන්ට මුද්‍රාකරන තුරු පොළොවට ද මුහුදට ද ගස්වලට ද හානියක් නොකරන්න" ය කියා පවසනු ලැබීය. සෑම ගෝත්‍රයකින්ම 12000 ක් බැගින් පුද්ගලයින් 144000 ක් දෙනා තෝරාගත්තේය. මෙම ගෝත්‍ර 12 ට දාන්ගේ ගෝත්‍රය ඇතුලත්ව නැත. ඒ වෙනුවට මනස්ගේ ගෝත්‍රය තෝරා ගත්තේය. විරුද්ධ ක්‍රිස්තුස්ගේ වසර තුනහමාර 3 1/2 පාලන කාලය තුළදී මෙම මුද්‍රාව කල අයට කිසිදු හානියක් නොවන්නේය.

144000 ක් දෙනා ඔසවා ගනු ලැබූවාට පසු මේ අය ඔසවා ගනු නොලැබ ඉතිරි වූනාවූ සෙනඟයි නමුත් ඔවුන් පීඩා කාලයේදී රූප නමස්කාරයක් නොමැතිව දෙවියන්වහන්සේ උදෙසා සාක්ෂිකාරයන්ව සිටි සෙනඟකි. දෙවියන්වහන්සේ විශේෂ අවස්ථාවක් දී මේ අයව තෝරාගනී.

## යුදාට අවසාන ගැලවීමෙ අවස්ථාව

දෙවියන්වහන්සේ යුදාවේ අත්හරිනු ලැබූ අයව මුදවාගැනීමට කැමැත්තෙන් සිටී. දේව වචනය මෙසේ පවසයි. ***"මක්නිසාද දෙවියන්වහන්සේගේ දීමනා ද කැඳවීම ද වෙනස් නොවන්නේය." (රෝම 11:29)***

ඔවුන් මෙසායාව ප්‍රතික්ෂේප කරනු ලැබූවත් ස්වාමින්වහන්සේ ඔවුන්ට විශ්වාසවන්තව සිටී.

***දාවිත්ගේ වංශය කෙරෙහි ද කරුණාවේ හා කන්නලව් කිරීමේ ආත්මය වගුරුවන්නෙමි. ඔවුන් තමුන් විසින් ඇන්නාවූ තැනැත්තා වන මා දෙස බලා සිට එකම පුත්‍රයෙකු ගැන වැලපෙන්නාක් මෙන් උන්වහන්සේ ගැන වැලපෙනවා ඇත. කුලුඳුලා ගැන ශෝකවෙන්නාක් මෙන් උන්වහන්සේ ගැන ශෝකවෙනවා ඇත. (සෙකරියා 12:10)***

යුදාවරු මෙසායාව ප්‍රතික්ෂේප කරනු ලැබූවත් ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ ආත්මය ඔවුන් වෙත වගුරවමින් ඔවුන්ට කරුණාව දක්වීමට කැමැත්තෙන් සිටී. නමුත් ඔවුන්ගෙන් 3/2 ක් මැරෙන අතර ඉතිරි 1/3 ගින්නෙන් ගලවනු ලබති." ***(සෙකරියා 13:8-9)***

දෙවියන්වහන්සේගේ සභාව ඔසවා ගැනීමෙන් පසු සියලුම ආකාර සෝදිසි වලින් පසුව යුදෙව්වන්ට දෙවියන්වහන්සේ අවස්ථාවක් ලබා දෙන්නේය. නමුත් ස්වාමීන්වහන්සේව සෙවීමට හා පිළිගැනීමට කදිම අවස්ථාව නම් මෙයයි. මේ ලෝකයේ තිබෙන පීඩාවන් වලින් මිදී ස්වාමීන්වහන්සේ සමඟ ඔසවා ගැනීමට නම් අප ස්වාමීන්වහන්සේ තුල ශුද්ධ වූ ජීවිතයක් ගත කිරීමට අවශ්‍යය.

ඉශ්‍රායෙල්වරුන්ට මිදි ඉතා වැදගත් වූ දෙයකි. මිදි වලින් යහපත් වූ ඵල හට ගැනීමට අවශ්‍යය.

අත්තික්කා ගස යහපත් වූ ඵල දැරිය යුතුය. මිදී වත්ත මැද තිබෙන්නාවූ අත්තික්කා ගසක් මෙන් අපට දී තිබෙන්නාවූ අවස්ථාව ප්‍රයෝජනයට ගෙන ඵල දරන්නාවූ පුද්ගලයන් විය යුතුය.

ඔලිව් ගසක් මෙන් අප ප්‍රයෝජනවත්ව ජීවත් විය යුතුය.

***"මනුෂ්‍යයාගේ සිත සතුටුකරන මුද්‍රිකපානයත්, ඔහුගේ මුහුණ පැහැපත් කරන්ට තෙලුත්, සිත ශක්තිමත්කරන ආහාරත් හටගන්වනසේක." (ගීතාවලිය 104:15)***

අප අපගේ ජීවිතය සාර්ථකවත් ඵලදරන්නාවුත් හා ප්‍රයෝජනවත් වූ ජීවිතයක් කරගනිමු.

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## “...කියවන්නා තේරුම් ගනීවා....” *(මතෙව් 24:15)*

### ස්වාමින්වහන්සේ කුඩා දරුවන්ට ප්‍රේමකරන සේක.

**මගේ ළමා කාලය තුල මා හැදුනේ කෙසේද?**

වර්ෂ 1949 ජූනි මස 03 වන දින මා මෙලොවට උපත ලැබීය. මගේ පවුලේ පලමු පිරිමි දරුවා මමය. මගේ පවුලේ සියලු දෙනාගේම ආශාව වූයේ මා ක්‍රිස්තියානි පූජකයෙකු වීම දැකීමයි. එම නිසා ඔවුන් මාව යාච්ඤා කිරීමට, දේව වචනය දැන ගැනීමට කුඩා කාලයේ පටන්ම මඟපෙන්නුවේය.



සභාවේ තිබූ ඉරුදින සබත් පාසැලටද මාව ගෙන ගියේය. අපගේ සභාව කුඹුරක් මැද පිහිටා තිබූ අතර එයට යාමට හරි පාරක්ද නොතිබුණි. මාගේ මාමලා මාව ඔවුන්ගේ කරපිට තබාගෙන දේවස්ථානයට ගෙන ගියේය. මගේ සබත් පාසල් ගුරුවරුන් වන එලියාස් පූජකතුමා මාගේ කුඩා කාලයේදීම මාව යේසුස්වහන්සේ වෙතට මගපෙන්නුවේය. මගේ ගුරුවරු මාහට බොහෝ සේ ප්‍රේමකලේය.

මගේ මවද මා අනාගතයේ දී හොඳ දේව දාසයෙක් ලෙස ගොඩනැගෙයි කියා විශ්වාස කලේය. දේවස්ථානයෙහි උදෑසන සහ දහවල් කාලයේ තිබූ දේව මෙහෙයන් වලටද නිතරම මා සහභාගී විය.

දේවස්ථානයේදී මගේ මව මා අසලම වාඩි කරවා ගත්තේය. ඇය සමඟ නමස්කාර කිරීමට හා ගීතිකා ගායනා කිරීමට මාව නිතරම උනන්දු කලේය. දේවගැති ඥානදාසම් මා හට සෑම් සෙල්ව රාජ් යන නම තබා දෙවියන්වහන්සේට කැපකරනු ලැබුයේය. ඔහු, ‘‘මෙම දරුවා සාමුවෙල් මෙන් වර්ධනය වී ඉතා පොහොසත් මනුෂ්‍යයෙක් වී දෙවියන්වහන්සේගේ බලවත් දාසයෙක් වෙයි’’ කියා ආශිර්වාද කලේය.

මා මෙම කාලයේ දී ඉතාම සන්තෝෂයෙන් සිටියෙමි. සෑම වසරකට නත්තල් කාලයේ දී තෑගි බෝගද මා හට ලැබුණි. 1952 වන වසරේ දී මා කටපාඩම් කල පදය තවමත් මා හට මතකයේ තිබේ.

***‘‘එකෙණෙහිම දේව දූතයා සමඟ මහත් ස්වර්ගීය සේවා සමූහයක් දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින්...’’ (ලූක් 2:13)***

1956 වසරේ දී මට වයස අවුරුදු 7 කි. පාස්ටර් දේව දාස් නැමති දේව දාසයෙක් දේව වචනය බෙදා ගන්නා විට දී ශුද්ධාත්මයාණන්වහන්සේ පුදුමාකාර ලෙස


## Echo of His Call Postal Courses for candidates in India only

**Pray for** THEOLOGICAL CORRESPONDENCE COURSE

Advanced Distance Education called **Theological Correspondence Course** is available in English – 537 pages and Tamil – 652 pages for Pastors, Evangelists, Christian Leaders and for lay people who have passion to do God's Ministry! A fee of Rs. 1000/- is charged. 7 Books with 149 Chapters are supplied. **Certificate in Ministry** will be awarded. **God will bless you!**



**The Chairman, Nehemiah Bible College,**
**Echo of His Call, Post Box 2957**, CHEPAUK, CHENNAI - 600 005.
**Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858**
**E.mail : biblecor@yahoo.co.in**

මට එළිදරව් විය. ස්වාමීන්වහන්සේගේ අභිමුඛත්වය ශුද්ධාත්මයාණන්වහන්සේ ගේ ආලේපය මට ඉතා හොඳින්ම දැනුනි.

දේව මෙහෙය අවසානයේ දී මා මගේ මවගෙන් මෙසේ ඇසුවෙමි. 'අම්මා, මේ පාස්ටර් ස්වර්ගයට ගොස් යේසුස්වහන්සේව හමුවෙයිද?' කියා, එවිට මගේ මව පිළිතුරු දෙමින්, 'ඔව් මාගේ පුතේ' කියා පැවසීය. 'මමත් ස්වර්ගයට ගොස් යේසුස්වහන්සේව මුණගැසීමට ඕනි. මට එය පුළුවන්ද?' කියා ඇසුවෙමි. එවිට මගේ මව, ''නුඹ යේසුස්වහන්සේව පිළිගෙන උන්වහන්සේ උදෙසා මේ ලෝකයෙහි ජීවත්වෙනවා නම්, නුඹේ ආශාව ඉෂ්ඨවෙනු ඇත'' කියා පැවසීය.

යේසුස්වහන්සේව මගේ හදවතට පිළිගැනීමට මගේ මව මට උපකාර කළේය. එදා සිට අද දක්වා මගේ ජීවිතයේ දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය අද්දැකීමට පටන්ගත්තේය.

ඉන් පසු මාව රජයේ පාසලකට ඇතුලත් කලේය. මගේ ආච්චි හැමදාම මාව පාසල වෙත ගෙන ගියේය. මා පාසලට යාමට පෙර මගේ මව මා පිට අත තබා ''ආදරණීය යේසුනි, අද මගේ පුතා පාසැලේදී ඉගෙනගන්නාවූ හැම පාඩමකටම ඔබවහන්සේගේ උදව් උපකාරය ලබා දෙන්න. ඒ සියල්ලම දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා පාවිච්චි කිරීමට ඔහුට උපකාර කරන්න' ය කියා යාච්ඤා කලේය.

පාසැලේ ගුරුවරු පවා මා දේව දාසයෙක්ය කියා විශ්වාස කලේය. ඔවුන් මට හොඳින් ඉගැන්නුවත් මා ටිකක් දඟකාරව සිටියේය. මා ගිය පාසැලේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්නුවේ නැත.

1957 වන වර්ෂයේ දී මගේ සබත් පාසැලේ ගුරුතුමිය, 'එම වසරේදී පැවැත්වෙන බයිබල් දැනුම මිනුම තරඟයට මගේ නම ඇතුලත් කර නොමැති නමුත් දේව කැමැත්ත නම් ලබන වසරේදී ඔබට එයට සහභාගිවීමට හැකිය, කියා පැවසීය.

මේ නිසා මගේ හිත කැඩී බිඳී ගිය අතර එය මා මගේ මව සමඟ බෙදා ගත්තෙමි. එවිට ඇය මට, 'බ්‍රහස්පතින්දා, සිකුරාදා හා සෙනසුරාදා යන දිනයන් වලදී රාත්‍රී කෑම නොකා යාච්ඤා කරන්නය කියා' මට පැවසීය. එහි සඳහන් වූයේ,

1. දෙවියන්වහන්සේට ප්‍රේමකරන දරුවා පීඩා කාලයේ දී භිය නොවෙයි.කුඩුවක් තුල පක්ෂියෙක් ආරක්ෂිතව සිටිනවාක් මෙන් යේසුස්වහන්සේ ඔවුන්ව ආරක්ෂා කරයි.

2. මගේ එඬේරා මාගේ ආත්මට සමගයි. මාව ඔහ ළඟට ලංකර ගන්න

**මා යාච්ඤා කරන විටදී**
**මට කථා කරන්න. ඔබගේ මාර්ගය මට පෙන්වන්න.**

1. ගැලවුම්කරු තුල ජීවත්වෙන්නාවූ අපගේ ආත්මයට සැනසීම තිබේ. මගේ ජීවිතය තුළින් ඔබගේ ප්‍රේමය අන් අය වෙතට විහිදේවා.

2. ඔබගේ දෙවියන්වහන්සේ කරණකොට ගෙන මගේ සටන ජය ගනිමි. මගේ ජීවිතය පුරාවටම මා ඔබ ගිය මාර්ගයෙහි යමි.මා සතුව ඇති සියලුම දේ ඔබගේ කැමැත්තට භාර දෙමි.

මා මෙම ගීතය කියමින් කඳුලින් යුක්තව යාච්ඤා කලෙමි. මා සෙනසුරාදා දින දේවස්ථානයට ගිය අවස්ථාවේ දී මගේ යාච්ඤාවට පිළිතුරු ලෙස පූජකතුමා මා හට කථාකර ගීතාවලිය 23 පරිච්ඡේදයම තරඟය සඳහා පාඩම් කරන්නය කියා පැවසීය.



මමද ඒ සියල්ල පාඩම් කර සම්පූර්ණ කල විටදී මා පළමු ස්ථානයට පත්වුවෙමි. තෑගි ලෙස මට ලස්සන සබන් පෙට්ටියක් ලැබුණි. මෙය කරණකොටගෙන මගේ ඇදහිල්ල හා යාච්ඤා ජීවිතය වර්ධනය විය.

''මට මොරගසන්න...'' (යෙරමියා 33:3) එදා සිට මේ වචනය මගේ තේමාව විය. දෙවියන්වහන්සේ සමඟ යාච්ඤාවෙන් සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට පටන්ගත්තෙමි.

************

RNI NO. TN/SIH/2006/17846


# NEHEMIAH BIBLE EVENING COLLEGE

**Pray for - Chepauk & Santhoshapuram, Chennai.**

ECHO OF HIS CALL 1969-2019 (ECHO GROUP)

ATA Regd. Candidate for Membership NEHEMIAH BIBLE COLLEGE CHENNAI ECHO OF HIS CALL Estd.: 1969

## Medium :Tamil

*Registered Candidate for Membership*

**Recognised by International Christian Leaders & Senior Pastors for the past 53 years**

**Certificate in Theology : One year**

**Diploma in Theology : Two years**

**Qualification : 10th Standard & above** **Rush for admission!**

**Contact : The Chairman, Nehemiah Bible College.**

10, MOHAMMED ABDULLAH 2ND STREET, BELLS ROAD, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org


## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.


**ECHO OF HIS CALL**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com



**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
**on 2nd MARCH 2022.**

**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**


***JESUS LOVES YOU!***

To

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**